## කවි කොළය

# හය වැනි මහින්ද!

අටසිය පහළොවේ නිදහස නමැති ගස
උදුරා, මරා යට කළ පසු පොළොවෙ පස
බිහිවිය රජෙක් නොදැරුව රන් කිරුළ හිස
හේ කවරෙක්ද? සය වැනි මේ මිහිඳු මිස

මව්බිම යළිත් එකසේසත් කෙරුව නොබා
නව රජු ඔබය - කොටි පරසක්වලට හඹා
රකිමුද තවත් සිහසුන කටුගෙයක ඔබා
ඔබ එහි වඩා හිඳුවමු පා පුටුව තබා

අඩපණ වී තිබුණු ජාතිය නොමළේය
යළි පණගසා ජයසක් හඬ ගුගුළේය
සිරුරෙහි ඔබේ මහ කලු සිංහළ ලේය
පැරකුම්, විජයබා, දුටුගැමුණුගෙ ලේය

මේ ආ ගමන ගංගාවක් පරිදි ඇදී
ආපසු නොයයි කිසිවිට යනු නොමැත සිඳී
මුළු ජාතියම දෑ හැඟුමෙන් එකට බැඳී
අද ඔබ වටා මහ පවුරක් විලස හිඳී

ලොව බලවතුන් බටහිර එක පෙළට සිට
යළි යුද විරාමයකට බල කරන විට
මහ යෝදයෙකු වී තනිවම රකින රට
රණ හඬ නැගී නොසැලී සිහ දදය යට

සාමයෙ තරිඳු නැග එයි ලක ගුවන ගැබේ
රට ගොඩ නගන සටනක් ඉදිරියෙහි තිබේ
ගැසුවොත් මේ රටේ දුප්පත්කමට ඇබේ
නිසැකව හයෙන් පහ බලයක් ඔබට ලැබේ

පවසති අයෙක් දිය යුතුයයි බලය බෙදා
දෙනු නම් පොලිස් බලතල බිම් උරුම සදා
විරුවෝ දැයේ දුන් ලක්මව රටට වදා
සමුගත්තෝද කුමකට? මහ පොළව බදා

ඉහටත් වඩා ඉහළින් දිය යුතු හරිය
දැනටම දී තිබේ තව දෙන්නට බැරිය
නොහැකිය ගලන ගඟ ආ පස්සට හැරිය
මුළු රට ඔබට දෙයි සහයෝගය දිරිය

ජනපති තුමනි! හිසමත
නැණ කිරුළ දැරූ
සංසෝදනය දහතුන්වැනි
උගුල මරූ
උදුරා දමා කෙරුවොත්
මේ විපත දුරූ
ඔබෙ නම රැඳෙනු ඇත
ඉර හඳ තිබෙන තුරූ



♦ **තලංගම ජයසිංහ**
**Sri Lanka**

# මහාචාර්ය එෆ්. ආර්. ජයසූරිය ජන්ම දින සමරු මුද්දරයක්

**ශ්‍රී**ලංකා විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ ආරම්භක විද්වතෙකු වූද, 1956 ජනතා පෙරළියේ නිර්මාතෘවරයෙකුවූ ද, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ හිටපු මහාචාර්ය එෆ්. ආර්. ජයසූරිය මැතිතුමන්ගේ සිය වැනි ජන්ම දිනය නිමිති කරගෙන ශ්‍රීලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ මුද්දර කාර්යාංශය විසින් මුද්දරයක් සහ මුල්දින කවරයක් නිකුත්කරන ලදී. රුපියල් 5 ක වටිනාකමින් යුත් මෙම සමරු මුද්දරය පසුගිය පෙබරවාරි මස 25 වෙනි දින කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී තැපැල් හා විදුලි සංදේශ අමාත්‍ය මහින්ද විජේසේකර මහතා අතින් නිල වශයෙන් නිකුත් කරන්නට යෙදුණි. මෙම උත්සවයට ගිහි-පැවිදි විශාල පිරිසක් සහභාගිවූ බව දැනගන්නට ඇත.

ශ්‍රීලංකා වාසී සාමාන්‍ය පෙළේ බහුතර ජනතාව ජයසූරිය මහතා අගය කරන්නේ එතුමා අප රටේ සාමාන්‍ය හා දිළිඳු පන්තියේ දරුවන්ට එතෙක් වරප්‍රසාද ලත් ධනපති පංතියට හිමිව තිබූ උසස් අධ්‍යාපනය ලබන්නටත් එමගින් විශ්වවිද්‍යාල අධ්‍යාපනය වෙත පිවිසෙන්නටත් අතිශය ඉවහල් වූ පුරෝගාමියෙකු වූ නිසාය. අධිරාජ්‍යවාදී යුගයේත් නිදහස ලබා කලක් ගතවන තුරුත් අප රටේ බලපවත්වන්නට වූයේ ඉංග්‍රීසි උගත් පෙළැන්තියේ පාලන හස්තයයි. white collar jobs යනුවෙන් තවමත් හඳුන්වන සුදු කරපටි රැකියාවන් සඳහා තෝරා ගත්තේත්, විශ්වවිද්‍යාලයට ඇතුල්වීම සඳහාද සුදුසුකම ලෙස පිළිගත්තේත් ඉංග්‍රීසි දැනුම සහ ඉංග්‍රීසියෙන් අධ්‍යාපනය ලත් කෙනෙකු වීමයි. රටේ බහුතරයක් සිංහළයින් වුවද ඔවුන්ගේ මව්බස වන සිංහළට පාලන තන්ත්‍රයේ හෝ අධ්‍යාපන ක්ෂෙත්‍රය තුළ හෝ කිසිදු තැනක් නොවීය. මෙය මගහරවා සිංහළ බසට හා සිංහළ අධ්‍යාපනයට තැනක් ලබාදීම මහාචාර්ය ජයසූරිය මහතා ප්‍රමුඛ දේශහිතෛෂින්ගේ නිරන්තර කල්පනාව විය. මෙම කටයුත්ත කිසිසේත් ලෙහෙසි පහසු දෙයක් වුනේ නැත. එවකට විශ්වවිද්‍යාල කුලපති සර් අයිවර් ජෙනිංග්ස් සමග හැප්පෙමින් මහා සටනක් කළ ජයසූරිය මහතා ආර්ථික විද්‍යාව පිළිබඳ සිංහළ පොත පත ලියා කෙසේ හෝ සිංහළ උගත් දරුවන්ට විශ්වවිද්‍යාලයට පිවිසෙන දොරටු විවෘතකර දුන්නේය. ඒ සිංහළ ප්‍රබෝධය 1956 දී අප රටේ වූ සමාජ පෙරළියටද හේතුවක් වුණි. ඒනිසාම මුළුගැන්වී තිබුණු සිංහළ භාෂාව ඉදිරියට ආවේය. සිංහළෙන් උසස් අධ්‍යාපන පොත පත බිහිවී සිංහලෙන් විද්‍යාව හදාරන්නට ගැමි දරුවන්ට ඉඩකඩ සැළසුණේය. ගම්බද දරුවෝද විශ්වවිද්‍යාලයට ඇතුළු වන්නට වූහ.

මේ සියල්ලට මග පෙන්වූ එෆ්. ආර්. ජයසූරිය මහාචාර්යතුමන්ගේ යුග මෙහෙවර අගයමින් අද එතුමන් කෘතවේදීව සිහිපත් කරන්නෙමු.

♦ **වෙනුර**






මරු සිටියත් පෙරමුණේ
ඔහු අමුණාවි කඩු මුණේ
මරුවාටත් මරු වුණේ
සිංහළයා පෙර දිනේ

**කලාසූරි අරිසෙන් අහුබුදු**
සංදේශය චිත්‍රපටයට පබැඳු ගීයකින්




## කොළඹ විත්ති




**ඉරිදා - SUN** ඔබාමා ඇමරිකාවේ ජනාධිපති වුණා විතරයි හුස්ම අරින්නවත් ඉඩක් නොදී දැන් සේරම මැන්වවට කරගෙන කියනවා ප්‍රශ්න විසඳන්නලු. කස්ටියක් කියනවා ඔක්කෝටම ඉස්සර වෙලා ඇමරිකාවෙ ආර්ථිකේ ගොඩ ගන්නලු. තව කට්ටියක් ඉරාකෙ යුද්ධෙ නවත්තන්නලු. ඊශ්‍රායලේට සපෝට් කරන්න එපාලු. ඇමරිකන් යුදෙව්වො කියනවා පලස්තීනෙට හොඳ පාඩමක් උගන්නන්නලු. ඒ අතරෙ ඇමරිකාවෙ ඉන්න දෙමළ කොටි සපෝටර්ලා කියලා තියනවා කොහොම හරි මැදිහත්වෙලා ප්‍රභාකරන් මුලතිව්වලින් අරගෙන කොහේ හරි රටකට පන්නලා දෙන්න කියලා. ඔය ආදී සේරම එකතු වෙලා ඔබාමා කන්න හදනවා. ඔබාමා ඊයෙ ජෝර්ජ් බුෂ්ට ටෙලිපෝන් කරලා කිව්වලු අනේ ජෝර්ජ් මට උඹ ගැන ඉරිසියා හිතෙනවා කියලා. බුෂ් හක හක ගාලා හිනාවෙලා කිව්වලු මයෙ පුතේ හිතාගනින් ඔය පටන් ගත්තා විතරයි කියලා.

**සඳුදා - MON** දැන් ලංකාව ඉංගිරිසියට හැරෙන්න දහලන බව හැම තැනකම පේනවා. කැතරින් පුංචි අම්මා කියනවා මහරගම පොළට ගියාමත් එතන ඉංග්‍රීසියෙන්ලු බඩු කිරන්නෙ, ගණන් කියන්නෙ. කීයද ළමයො මේ බණ්ඩක්ක කියලා ඇහුවම, ඒ කොල්ල කිව්වලු නෝනා වන් කිලෝ සෙවන්ටි රුපීස් වගේ වෙනවා, හැබැයි අර එහා තියෙන ටිකක් වේලිච්ච ඒවා දෙන්නම් පිප්ටි ටූවලට කියලා. තව ටිකක් වේලුනාම මං එන්නම් කියලා පුංචි අම්මා ආවලු. ඒපොළ ලඟම තේවතුර කඩේක උඩ තට්ටුවෙ බෝඩ් එකක් ගහලා තියනවයි කිව්වා, එතන එංගලන්තෙ කේම්බ්‍රිජ් විභාගවලට උගන්වන හවස පන්ති තියනවය, ප්‍රතිපල සීයට සීයයි කියලා. වැඩේ නරක නැහැ, එතනින් තේවතුර එකකුත් බීලා එංගලන්තෙ යන්නත් හදාගන්න පුළුවන් කියලා කවුද කියනවා ඇහුණාලු.

**කුජදා - TUE** ගින්තොට නැන්දා ටෙලිපෝන් කරපු වෙලාවෙ කිව්වා ගාල්ලෙ මන්ත්‍රී කෙනෙක් ගිය අවුරුද්දෙ කිව්වලු අපේ හමුදාවට මේ කපේදි කොටි එක්ක යුද්ධ කරලා දිනන්න බැරිය, හැබැයි බැරිවෙලාවත් දිනුවොත් එදාට එයා වෙන ආගමකට යනවයි කියලා. නැන්දා කියනවා මිනිහා ළඟදිම නිගණ්ට ආගමට යාවිය කියලා ගාල්ලෙ මිනිස්සු බලාපොරොත්තු වෙනවලු. මම ඇහුවම ඒක කොයි විදියෙ ආගමක් ද කියලා, නැන්දා කිව්වා දරුවො ඒ ආගමේ අය පාරෙ යන්නෙ ඇඟේ එක නූල් පොටක්වත් නැතුව කියලා. අනේ හොඳට තියේවි.

**බුදදා- WED** චන්ද්‍රිකා නෝනා දැන් ලෝකෙ වටේ යනවා, ලංකාවෙ දැන් තියන රජයට දොස් කිය කිය. දැන් වුනත් කොටි එක්ක සාකච්ඡා කරන්න බැරි ඇයි කියලා එයා අහනවා. ඒ පාර කවුද අහලා තියනවා මැඩම් කවුරු එක්කද සාකච්ඡා කරන්නෙ? දැන් පරණ කොටි හතර පස් දෙනයි නේ ඉන්නෙ, හිටපු ඇයො ටික මැරිලා නේ, මේ ඉස්කොලේ බාලාංශ පන්තිවල හිටපු පොඩි ඇයො ටිකක් නේ ඉතුරු වෙලා ඉන්නෙ කියලා. එයා කිව්වලු මං හිටියානම් උන් එක්ක හරි සාකච්ඡා කරනවා කියලා. මොනවද කියලා එයා කියලා නැහැ.

**ගුරුදා- THU** ආතර් මාමයි මේ නිව්ස් එක කිව්වෙ. කොටින්ගෙ ගුවන් යානා දෙකක් කොළඹදි වෙඩි තියලා විනාස කළාට පස්සෙ ප්‍රභාකරන් දැන් ඉන්න තැන මුලතිව් කැලෑවෙ තව යානයක් තියනවා කියල ආරංචි වුණාලු. හැබැයි දැන් ප්‍රශ්ණෙ ඒක පියාසර කරවන්නෙ කොහොමද කියලා. පුහුණු කරපු පයිලට්ලා සේරම මැරිලා. මේ අන්තිම යානයෙන් ගිහිං බෝම්බ කීපයක් කොළඹට අතඅරින්නෙ කොහොමද කියලා ප්‍රභාකරන් හිත හිත ඉන්නකොට එක කොටියෙක් දුවන් ඇවිත් කිව්වලු, “මේ අහන්න බොස්, මම අර පොල්ගහට බඩගාලා ඒ මුදුනෙ ඉන්නම්, කොහොම හරි මේක උඩට නග්ගලා එතෙන්ට ගත්තොත් මං එතන ඉඳලා අරං යන්නම්” කියලා. විස්තර අහලා බැලින්නම් ඒ කොටියා පයිලට් කෙනෙක් නෙවෙයි වවුනියාවෙ ලොරි ඩ්‍රයිවර් කෙනෙක්. ප්‍රභාකරන් කුණුහරුපෙන් බැන්නලු, “යකෝ ලොරියක් එළවනවා වගේ ප්ලේන් එකක් එළවන්න පුළුවන්ද? ” කියලා.

**කිවිදා- FRI** කිලිනොච්චියෙ කැලෑවෙ තැන් තැන්වල කොටි විශාල කාලතුවක්කු ඇතුළු ආයුධ තොග පිටින් බිම වළලලා ගිහිං. තව තැනක උන් සයනයිඩ් කරල් දහස් ගණනක් පෙට්ටිවල දාලා අරන් තියලා. උන් ඒකෙන් දෙමළ ජනතාවට දෙන පණිවිඩේ මං හිතන්නෙ මේකයි. අනාගතේ සිංහළ මිනිස්සුන්ට එරෙහිව කවදාවත් ආයුධයක් අල්ලන්න එපා. එහෙම හිතුනොත්, ඊට ඉස්සෙල්ලා බොලා පවුල් පිටින් මේ සයනයිඩ් කාපල්ලා.

**ශනිදා- SAT** මේ යුද්ධෙ හන්දා සවුත්තු වුණේ ලංකාව නෙවෙයි. ලෝකෙ රටවල් ගණනාවක් සවුත්තු වුණා. ඇමරිකාව නෝර්වේ එංගලන්තෙ ඉන්දියාව ආදී රටවල් කීපයක්ම ත්‍රස්තවාදෙට උදව් කළ හැටි මුළු ලෝකෙටම පෙනුණා. ලෝකෙ පුරා ඉන්න දෙමළ ජනයාගෙන් බහුතරයක්ම අමූලික බොරු කියන තමන් ඉපදුණු රටට විනාශය පතන දුෂ්ට නරුමයන් බව කාටත් ඔප්පු වුණා. උන් ලංකාවෙන් ගිය එකම හොඳයි. උන්ගෙ හැටි දැනගන්න යුද්ධයක් කරන්නම සිද්ධ වුණා.